{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்கலாம் - வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

13 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024

දේශපාලන විද්‍යාව - I | 23 | S | I

පාසලේ නම :- ..................................................

ඇතුළත්වීමේ අංකය :- ..................................................

පැය දෙකයි

**උපදෙස් :-**

- මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් දෙකකින් සමන්විතය.
- **A** කොටස බහුවරණ ප්‍රශ්න 30කින් සහ **B** කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සැපයිය යුතුය.
- එක් පිළිතුරුකට ලකුණු දෙක බැගින් ලකුණු 100කි.

---

## A - කොටස

- අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

1. දේශපාලනය **කිරීම** යන්නෙන් අදහස් වන්නේ,

(1) ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලි අධ්‍යයනය කිරීම .
(2) ශාස්ත්‍රීය ලෙස දේශපාලනය අධ්‍යයනය කිරීම .
(3) ඡන්ද දායකයන්ගේ චර්යාව අධ්‍යයනය කිරීම .
(4) ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීමය.
(5) වෘත්තීය දේශපාලනඥයන්ගේ චර්යාව හැදෑරීමය. (.....)

2. බහු විෂයක ප්‍රවේශයක් දේශපාලන විද්‍යාවට අවශ්‍ය වීමට හේතු වන්නේ,

(1) දේශපාලනය යන්න සමාජයේ අනෙකුත් පැතිකඩවලින් වියුක්ත ව පවතින බැවිනි.
(2) දේශපාලන විද්‍යාව සෑම විට ම අනෙක් ශික්ෂණයන් හා සම්බන්ධ වී ඇති බැවිනි.
(3) දේශපාලන විද්‍යාවේ එයට ම ආවේණික න්‍යාය හා සංකල්ප පවතින බැවිනි.
(4) දේශපාලන විද්‍යාව නිශ්චිත ශාස්ත්‍රීය විෂයයක් ලෙස අනන්‍ය වී ඒ මතම පැවතීම හේතුවෙනි.
(5) දේශපාලන විද්‍යාව වෙනත් ශික්ෂණයන් සතු විධික්‍රම පෝෂණය කරණු ලැබීම හේතුවෙනි. (.....)

3. නූතන භෞමික රාජ්‍යයක ප්‍රධාන අංග ඇතුළත් පිළිතුර වන්නේ,

(1) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය
(2) පුරවැසිභාවය, නිශ්චිත දේශ සීමාව, ආණ්ඩුව, ස්වාධිපත්‍යය
(3) ජාතික පදනම, භෞමිකත්වය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය
(4) ජනගහනය, නිශ්චිත දේශ සීමාව, ආණ්ඩුව, ස්වාධිපත්‍යය
(5) ජාතික පදනම, නිශ්චිත දේශ සීමාව, ආණ්ඩුව, ස්වාධිපත්‍යය (.....)

4. යුක්තිය සම්බන්ධව සමකාලීන දේශපාලන දාර්ශනිකයෝ ඇතුළත් කාණ්ඩය වන්නේ,

(1) මාර්තා නස්බවුම්, ජෝන් රෝල්ස්, රොබට් නොසික්, මයිකල් සැන්ඩල්
(2) සී රයිට් මිල්ස්, යර්ගන් හබර්මාස්, චාල්ස් ටේලර්, මිෂෙල් ෆූකෝ
(3) හොබ්ස්, රූසෝ, මැකියාවෙල්ලි, කාල් මාක්ස්
(4) ජෝන් රෝල්ස්, යර්ගන් හබර්මාස්,චාල්ස් ටේලර්, රූසෝ
(5) අයිසයා බර්ලින්, රොනල්ඩ් ඩ්වෝකින්, ජෝන් රෝල්ස්, චාල්ස් ටේලර් (.....)

5. සාම ගිවිසුමක ලක්ෂණයක් නොවන්නේ,

(1) ගිවිසුම් කොන්දේසි නිසි පරිදි ක්‍රියාත්මක කරන බවට ශපථ වීම.
(2) මානව අයිතිවාසිකම් කඩවීම්වලට පිළිතුරු සෙවීම ආදි කාර්යයන්ට හවුලේ එකඟ වීම.
(3) ගැටුමේ පාර්ශ්ව දෙක ම, ගැටුම අත්හිටුවීමට හෝ අවසන් කිරීමට හෝ එකඟ වීම.
(4) කැරලිකාර පාර්ශ්වය දේශපාලන ප්‍රධාන ප්‍රවාහයයෙන් පිටමං කිරීම.
(5) යුද්ධයෙන් සරණාගතයන් වූ සිවිල් ජනයා යළි පදිංචි කරවීම

(.....)

6. පුරවැසිභාවයට අදාළ අංගයක් නොවන්නේ,

(1) රාජ්‍යයක භූමිය තුළ ජීවත් වන්නවුන්ට පුරවැසි භාවය ප්‍රදානය කළ හැකිය.
(2) පුරවැසියා යන්නෙහි වර්තමාන අර්ථය''රාජ්‍යයේ සාමාජිකයා'' යන්න යි.
(3) උප්පතිය මගින් හෝ ලියාපදිංචියෙන් ලබාගත හැකිය.
(4) වර්තමාන රාජ්‍යයට පුරවැසිභාවය අහිමි කළ නොහැකිය
(5) මාෂල් 'සමාජ පුරවැසි භාවය' යන සංකල්පය ඉදිරිපත් කරයි.

(.....)

7. දේශපාලන විද්‍යාව සිවිල් සමාජය ගැන උනන්දු වීමට හේතුවක් නොවන්නේ,

(1) පුරවැසියන් දේශපාලන වශයෙන් සවිබල කිරීමට දායක වන බැවිනි.
(2) එමගින් රටක ප්‍රජාතන්ත්‍රවාදය ගැඹුරු කිරීමට දායක වනබැවිනි
(3) දේශපාලන පක්ෂවලට මග හැරෙන කරුණු පිළිබඳව පුරවැසියෝ සංවිධානය කරන බැවිනි.
(4) පුරවැසි දේශපාලන සහභාගිත්වයට අවකාශයක් ලැබෙන බැවිනි.
(5) රාජ්‍ය ,පක්ෂ මත පදනම් වූ පුළුල් පැතිකඩක්, සිවිල් සමාජයෙන් නියෝජනය වන බැවිනි.

(.....)

8. **ගෝත්‍රික රාජ්‍යයට** අයත් අංගයක් වන්නේ,

(1) නායකයකයාට අසීමිත අධිකාරයක් හිමි වීමය .
(2) මෙම ක්‍රමවල පාලන බලතල සමාජය තුළ ඒකරාශී වීමය .
(3) නායකයන් ගේ පවුල් සාමාන්‍ය පවුල් වලින් වෙනස් වීමය.
(4) මෙම ක්‍රම පාලනය වූයේ චාරිත්‍ර වාරිත්‍ර, අභිචාරවිධි සහ සම්ප්‍රදාය අනුව වීමය .
(5) ප්‍රථමික දේශපාලන සංවිධාන වූ මේවායේ විධිමත් සංවිධාන ව්‍යුහයක් පැවතීමය.

(.....)

9. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,

(1) විධායකය සහ ව්‍යවස්ථාදායකය වෙන් වෙන් මැතිවරණ හරහා තෝරාපත් කරගනු ලැබීමය.
(2) විධායක සහ ව්‍යවස්ථාදායක අංශ අතර විධිමත් පුද්ගල බෙදීමක් පැවතීමය.
(3) රාජ්‍ය නායකයා සෘජු ලෙසින් ම තෝරාපත් කර ගැනීමක් සිදු නොවීමය.
(4) ආණ්ඩුව රඳ පැවැත්මට පාර්ලිමේන්තුවේ සහාය අවශ්‍ය නොවීමය.
(5) කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෝ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයෝ නොවීමය. (.....)

10. දේශපාලන විද්‍යාවේ විද්‍යාත්මක න්‍යාය පිළිබඳ නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.

(1) මෙම න්‍යායික ධාරාව හඳුන්වන්නේ ප්‍රත්‍යක්ෂ මූලවාදී දේශපාලන විද්‍යා න්‍යාය ලෙසය.
(2) දේශපාලන විද්‍යාවට විද්‍යාත්මකත්වය පිළිබඳ න්‍යායාත්මක අදහස එකතුවූයේ 1830 දශකයේ ය.
(3) ආනුභවික දත්ත සහ සාක්ෂ්‍ය පදනම්ව''නීති'' පද්ධති ගොඩ නැඟීම සිදුවේ.
(4) මෙහිදී ලෝකයේ සිදුවන දේ එසේ සිදුවන්නේ මන්දයි, නීතියකට අනුව පැහැදිලි කරයි.
(5) දේශපාලන විද්‍යාවට මෙම න්‍යාය එක් වූයේ සමාජීය විද්‍යාවන්ගේ ''විද්‍යාත්මක හැරීම'' තුළිනි.

(.....)

11. **ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයට අදාළ ප්‍රකාශය වන්නේ,**

(1) ඉන්දියාවේ ආණ්ඩුක්‍රමය තුළ සමමිතික බල බෙදීමක් දැකිය හැකිය.
(2) ඉන්දියානු රාජ්‍යයේ සන්ධීයත්වය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සෘජු ව ම ප්‍රකාශ කර ඇත
(3) ඉන්දියාවේ ආණ්ඩුක්‍රමය ''සහ-සන්ධීය'' ක්‍රමයකැයි සමහර විචාරකයෝ දක්වති.
(4) නව ප්‍රාන්ත රාජ්‍ය නිර්මාණය කිරීමත්, ඉන්දියානු සන්ධීය ක්‍රමයේ අපහසු කාර්යයකි
(5) හදිසි අවස්ථා බලතල යටතේ ඉන්දීය මධ්‍යම ආණ්ඩුවට ඒකීය රාජ්‍යයක් මෙන් ක්‍රියා කළ හැකි ය

(.....)

12. ෆැසිස්ට්වාදී රාජ්‍ය මාදිලියට අදාළ අංගයක් වන්නේ,

(1) ෆැසිස්ට් රාජ්‍යයේ සෑම ජන මාධ්‍යයක් ම නායක වන්දනය හුවා දක්විය යුතු ය.
(2) ෆැසිස්ට් රාජ්‍යය සමාජ සංවිධානයක් වන අතර එය සමාජයට සමාන්තරව පවතින්නක් වේ.
(3) සමාජයේ ජනතාව සේම රාජ්‍යයද වැදගත් වන බව දක්වයි.
(4) ෆැසිස්ට්වාදය මඟින් රාජ්‍යය සහ ජාතිය සර්ව අසම තත්ත්වයට පත්කර ඇත.
(5) ෆැසිස්ට්වාදයට අනුව රාජ්‍යය සදාතනික නොවේ. (.....)

13. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයට අදාළ නොවන ප්‍රකාශය වන්නේ,

(1) ව්‍යවස්ථාදායකය රාජ්‍ය මන්ත්‍රණ සභාව නමින් හැඳින්විය.
(2) වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් හඳුන්වාදීමේ පදනම වැටිණ.
(3) ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නැංවීමට දේශපාලන පක්ෂ අවශ්‍ය විය.
(4) මේ ආණ්ඩු ක්‍රමයෙන් දේශපාලන වශයෙන් ජනතාව සවිබල ගැන්වුණි
(5) වාර්ගික නියෝජනය අහෝසි කරමින් පළාත්බද නියෝජනය ඇති කරන ලදී

(.....)

14. ප්‍රතිපත්ති ක්‍රියාදාමය ආශ්‍රිතව අදාළ නොවන ප්‍රකාශය වන්නේ,

(1) ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය යනු අවධානය යොමු ව ඇති ගැටලු ලැයිස්තුව කි.
(2) ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම, පනත් කෙටුම් පතක් නීතියක් බවට පත්වීමට පෙර සිදුවන දේ ය.
(3) හතරවන පියවරෙහි දී ප්‍රතිපත්ති ඇගයීම සිදුවේ
(4) ප්‍රතිපත්ති ඇගයීමෙන් පසු ප්‍රතිපත්ති සංශෝධනය කිරීම කළ හැකිය.
(5) ප්‍රතිපත්ති ක්‍රියාදාමය සංකීර්ණ ක්‍රියාවලියක් සරල කර දක්වීමකි

(.....)

15. ඒකීය ආණ්ඩු ක්‍රමයේ ලක්ෂණයක් නොවන්නේ,

(1) ඒකීය ආණ්ඩුක්‍රමය සාපේක්ෂ වශයෙන් අසංකීර්ණ ආණ්ඩුක්‍රමයක් ලෙස දක්වේ.
(2) රාජ්‍යයේ ස්වාධිපත්‍ය බලය තනි, ජාතික ආයතනයකට පවරා තිබීම.
(3) ඒකීය ආණ්ඩුක්‍රමවල ස්වාධිපත්‍ය බලය මුළුමනින් ම පැවරී ඇත්තේ ජාතික මධ්‍යම ආණ්ඩුව වෙත ය.
(4) රාජ්‍යවල ව්‍යවස්ථාදායකය බොහෝවිට ඒක මණ්ඩලවාදය මත පදනම් වේ.
(5) මධ්‍යම ආණ්ඩුව විසින් පහළ මට්ටමේ ආයතන අහෝසි කිරීමේ අධිකාරිත්වය අහිමි කරගනී (.....)

16. දේශපාලන විද්‍යාවේ විෂය පථය සම්බන්ධව අදාළ නොවන්නේ,

(1) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය ඉතා පුළුල්ය
(2) ශත වර්ෂ විසිපහකට ආසන්න කාලයක් පුරා වර්ධනය වූ සහ විකාශනය වූවකි.
(3) විෂය පථය කාලීනව නවමු මාතෘකාවන් ඔස්සේ ප්‍රසාරණය වනු දැකිය හැකිය.
(4) දේශපාලන විද්‍යා විෂයට නව තේමා බොහෝ වේගයෙන් පැමිණීම සිදුවේ.
(5) දේශපාලන විද්‍යාවේ විෂය පථය පිළිබඳව දේශපාලඥයින් අතර පොදු එකඟතාවයක් පවතී.

(.....)

17. ලිබරල් නිරාගමිකවාදයේ මූලධර්මයක් නොවන්නේ,

(1) රාජ්‍ය කිසි ම ආගමකට පක්ෂපාතිත්වයක් නොමැති විය යුතු ය.
(2) ආගම අහෝසි කළ යුතු යයි ලිබරල් නිරාගමිකවාදය ප්‍රකාශ කරයි.
(3) ආගම මනුෂ්‍යයන්ගේ පෞද්ගලික දෙයක් වන අතර එය දේශපාලනයට ගෙන ආ යුතු නැත.
(4) රාජ්‍යය ආගම සමඟ අනන්‍ය නොවීම.
(5) රාජ්‍යය සහ පල්ලිය ආයතනික වශයෙන් වෙන් කිරීම.

(.....)

18. යටත් විජිතකාරක රාජ්‍යය සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය තෝරන්න.

(1) යටත් විජිතකාරක රාජ්‍යයේ අවශ්‍යතා වෙනුවෙන් බලහත්කාරී ලෙස රඳා පවතී.
(2) ආණ්ඩුව නියෝජනය කරන්නේ යටත් විජිත සමාජයේ අභිලාෂ නොව මව් රාජ්‍යයේ අභිලාෂ යි.
(3) යටත් විජිතයේ සාමය හා පිළිවෙළ පවත්වාගෙන යාමට ප්‍රමුඛත්වය දෙයි.
(4) යටත් රාජ්‍යයේ ආර්ථික, සමාජ, සංස්කෘතික හා දේශපාලන අවශ්‍යතාවලට අනුව මෙහෙයවයි.
(5) මෙම රාජ්‍යයන්ට ඇත්තේ අවම සුජාතභාවයකි.

(.....)

19. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මඟින් ලංකාවේ ඇති කළ දේශපාලන ප්‍රතිඵලයක් නොවන්නේ,

(1) පැවති ද්විත්ව පාලනය අහෝසි කොට මුළු රට ම එක පොදු නීති ක්‍රමයකට ගෙන ඒම.
(2) දිස්ත්‍රික් පහකට බෙදා, රටේ පරිපාලන කටයුතු විමධ්‍යගත කරන ලදී.
(3) නීති සම්පාදනය සම්බන්ධ ව ව්‍යවස්ථාදායක සභාව ඇතිකරන ලදී.
(4) ඒක බල කේන්ද්‍රීය මධ්‍යගත ඒකීය රාජ්‍යයකට අවශ්‍ය වන පදනම දැමීමක් විය.
(5) ලංකාව ව්‍යවස්ථානුකූල පාලනයකට යොමු කරන ලදී.

(.....)

20. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි ප්‍රධාන ආයතනයක් වන්නේ,

(1) ලෝක කම්කරු සංවිධානය.
(2) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල.
(3) ආරක්ෂක මණ්ඩලය.
(4) ලෝක වෙළඳ සංවිධානය
(5) ආසියානු සංවර්ධන බැංකුව

(.....)

- **අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

21. **දේශපාලන පක්ෂ**

A ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයේ, නැති ව ම බැරි අංගයකි.
B දේශපාලන පක්ෂයකට ප්‍රතිපත්තිමය සහ මතවාදී අනන්‍යතාවක් පවතී.
C දේශපාලන බලය ලබාගැනීම මඟින් ආණ්ඩුබලය ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරයි.
D දේශපාලන පක්ෂ දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියයි
E මැතිවරණ මඟින් ආණ්ඩු බලය ලබා ගැනීම අරමුණු කර ගෙන ගොඩනගා ඇති සංවිධානයකි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

22. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය,

A මූලික වශයෙන් ධනවාදී ආර්ථික සමාජ ක්‍රමය මත පදනම් වූ දේශපාලන ක්‍රමය වේ.
B ධනවාදී ආර්ථික ක්‍රමය හා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය එකිනෙක සම්බන්ධ කරයි.
C නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමයක මූලික ම ලක්ෂණයකි
D මිනිස් නිදහස තහවුරු කිරීම උදෙසා 17 වැනි ශතවර්ෂයේ අග භාගයේ පැතිර යයි.
E රාජ්‍යයේ අසාහයත්වය පිළිබඳ සංකල්පය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික හරයකි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

23. ප්‍රංශයේ ව්‍යවස්ථාදායකය සම්බන්ධව අදාළ ප්‍රකාශ කාණ්ඩය වන්නේ,
A ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වේ .
B ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව වේ.
C නිල කාලය වසර 5ක් වේ
D ප්‍රථම මණ්ඩලය ජාතික මන්ත්‍රණ සභාව වේ.
E සෙනෙට් සභාව නියෝජිතයන් 32 දෙනකු ගෙන් යුක්ත වේ

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

24. **සමාජ ප්‍රජාතන්ත්‍රවාදය,**

A යුරෝපයේ ආරම්භ වූයේ මාක්ස්වාදයේ ආභාසය ලබමිනි.
B ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ නායක එඩ්වර්ඩ් බර්න්ස්ටයින් අනිවාර්ය කම්කරු පන්ති විප්ලවයක් පිළිබඳ ව අදහස පිළිගනී
C දහනව වන සියවසේ අග භාගයේ දී ආරම්භ වූ වර්තමානයේත් පවත්නා මතවාදයකි.
D ජර්මන් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය මෙම මතවාදයෙහිලා පුරෝගාමී විය
E සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය, ඓතිහාසික වශයෙන් කම්කරු පන්තිය මත පදනම් වූවකි.

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

25. ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ ප්‍රධාන ධාරා 5ට අයත් වන්නේ,
A පශ්චාත් නූතන ස්ත්‍රීවාදය
B සමාජවාදී ස්ත්‍රීවාදය
C ෆැසිස්ට්වාදී ස්ත්‍රීවාදය
D රැඩිකල් ස්ත්‍රීවාදය
E පශ්චාත්-යටත්විජිත ස්ත්‍රීවාදය

(1) ABCD (2) ABCE (3) ABDE (4) ACDE (5) BCDE (.....)

අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. ඒ එක් එක් ප්‍රශ්න අංකයට අදාළව දී ඇති යෙදුම් යුගල සම්බන්ධයෙන් පහත i වගුව සඳහා යොමුවෙහි සඳහන් 1,2,3,4 සහ 5 යන වරණවලින් සුදුසු වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

වගුව සඳහා යොමුව

| අංකය | ප්‍රකාශය i | ප්‍රකාශය ii |
|---|---|---|
| 1 | සත්‍ය | සත්‍ය |
| 2 | සත්‍ය | අසත්‍ය |
| 3 | අසත්‍ය | සත්‍ය |
| 4 | අසත්‍ය | අසත්‍ය |
| 5 | සත්‍ය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් තහවුරු කරයි. |

i. වගුව

| ප්‍රකාශය i | ප්‍රකාශය ii | |
|---|---|---|
| 26. සෝල්බරි ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ 1947-1959 කාලයෙහි මන්ත්‍රී සංඛ්‍යාව 101 ක් විය. | 1960 සෝල්බරි ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වූ ඉතිරි කාලය තුළ මන්ත්‍රී සංඛ්‍යාව 160 ක් විය. | (….) |
| **27.** 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව නීති සම්පාදනය කිරීමේ බලතල සහිත එක ම ආයතනය විය. | 45 වන වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාවට හිමි වන ව්‍යවස්ථාදායක බලය අත්හැරීමට, පැවරීමට හෝ කිසි ම ආකාරයකින් අන් සතු කිරීමට හැකි යාවක් පැවතුණි. | (…..) |
| **28.** 1978 මුල් ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබුණු විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු සංඛ්‍යාව 196 වන බව සඳහන් කර තිබිණි. | 14 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සාමාජිකයන් 225ක ගෙන් යුත් පාර්ලිමේන්තුවක් ස්ථාපිත කිරීමට කටයුතු කෙරුණි. | (……) |
| **29.** 17 වන ව්‍යවස්ථා සංශෝධනය මඟින් පාර්ලිමේන්තු සභාව හඳුන්වා දෙනු ලැබිණ. | 19 වන සංශෝධනයෙන් ජනාධිපතිවරයාගේ නිල කාලය වසර හයේ සිට පහ දක්වා අඩු කරනුලැබිණි. | (……) |
| 30. 1978 ජනාධිපති තෝරා ගැනීමේ ක්‍රමය බහුත්ව ක්‍රමයට අයත් වන අතිරේක ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමය මත පදනම් වේ. | මෙම ක්‍රමය යටතේ ඡන්දදායකයාට සිය කැමැත්තට අනුව ඡන්ද අපේක්ෂකයන් 1, 2 වශයෙන් පෙළ ගැස්විය හැකි ය | (……) |

## B - කොටස

- ප්‍රශ්න අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

31. දර්ශනවාදී ප්‍රවේශයේ මූලික ලක්ෂණ **දෙකක්** දක්වන්න.

(i) ……………………………………………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………………………………………

32. පහත කෘතිවල කතුවරු පිළිවෙලින් ලියා දක්වන්න.

i. දේශපාලනය වෘත්තියක් වශයෙන් ………………………………………………………

ii. නූතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා- ………………………………………………………

33. ඒකීය රාජ්‍යයන්හි මධ්‍යයේ සිට පහළ මට්ටම්වලට පරිපාලන බලය විසුරුවා හැරීම ප්‍රධාන ආකාර තුනකින් සිදු වේ. ඉන් දෙකක් නම් කරන්න.

i. - ………………………………………………………………………………………

ii. - ………………………………………………………………………………………

34. "ඓතිහාසික භෞතිකවාදය" ට අනුව මාක්ස් සමාජ සැකැස්ම මූලික මට්ටම් දෙකකින් සමන්විත වන බව දක්වයි. එම මට්ටම් දෙක දක්වන්න

(i) ……………………………………………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………………………………………

35. "සමූහාණ්ඩුවාදී අදහස්වල වර්ධනය අවධි 4 ක් යටතේ සිදුවේ" ඉන් මුල් අවධි දෙක පිළිවෙලින් දක්වන්න.

(i) ……………………………………………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………………………………………

36. නිරාගමිකවාදය ලෝක දේශපාලනයට අදාළ වීමට බලපාන ප්‍රධාන කරුණු දෙක දක්වන්න.

(i) ……………………………………………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………………………………………

37. "ගැටුම් සමථකරණ සාහිත්‍යයේ සහමන්ත්‍රණය සිදු කරන ආකාර තුනක් දක්වේ" ඉන් දෙකක් දක්වන්න.

(i) ……………………………………………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………………………………………

38. සෝල්බරි ආණ්ඩු ක්‍රමය යටතේ රාජ්‍ය සේවා කොමිසම පත් කිරීමට බලපෑ ප්‍රධාන හේතු දෙක දක්වන්න.

(i)……………………………………………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………………………………………

39. යටත් විජිත ආර්ථික හා සමාජ පරිවර්තනය සිදු වූ තල දෙක දක්වන්න.

(i)……………………………………………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………………………………………

40. පරමාධිපත්‍යයට අයත් බලතල දෙකක් දක්වන්න.

(i) ……………………………………………………………………………………………………………………

(ii) ……………………………………………………………………………………………………………………

41. "ආණ්ඩුවේ වග වීම පිළිබඳව අදහසට මාන දෙකක් පවතී". ඒවා දක්වන්න
(i) ……………………………………………………………………………………………………………………
(ii) ……………………………………………………………………………………………………………………

42. ඇමෙරිකානු ව්‍යවස්ථාවේ සංශෝධන ක්‍රියා පටිපාටියට අයත් ක්‍රමවේද දෙක දක්වන්න
(i) ……………………………………………………………………………………………………………………
(ii) ……………………………………………………………………………………………………………………

43. ස්විට්සර්ලන්ත ෆෙඩරල් ව්‍යවස්ථාදායකයේ මණ්ඩල දෙක දක්වන්න.
(i) ……………………………………………………………………………………………………………………
(ii) ……………………………………………………………………………………………………………………

44.(i)ප්‍රංශ කොමියුනයේ මහජන නියෝජන සභාව හඳුන්වන නම කුමක්ද?……………………………
(ii)එහි ප්‍රධාන විධායක නිලධාරියා කවුද?……………………………………………………………

45. 13 වන ව්‍යවස්ථා සංශෝධනය හා පළාත් සභා පනත අනුව පළාත් සභාවක විධායකය සමන්විත ආයතන දෙක දක්වන්න.

(i) ……………………………………………………………………………………………………………………
(ii) ……………………………………………………………………………………………………………………

46. මැක්ස් වෙබර් විවිධ සමාජ ක්‍රමවල පවතින අධිකාරී ක්‍රම තුනක් හඳුනාගෙන ඇත. ඒවායින් දෙකක් දක්වන්න.

(i) ……………………………………………………………………………………………………………………
(ii) ……………………………………………………………………………………………………………………

47. අධිකරණයේ ස්වාධීනත්වය යන්න පාර්ශව තුනක සහභාගීත්වයෙන් ආරක්ෂා කළ යුතු මූලධර්මයකි. එම පාර්ශ්ව තුනෙන් දෙකක් දක්වන්න.
(i) ……………………………………………………………………………………………………………………
(ii) ……………………………………………………………………………………………………………………

48. ශ්‍රී ලංකා පාර්ලිමේනතුවට ජනතා ඡන්දයෙන් තෝරාපත් කරගනු ලබන මන්ත්‍රීවරුන් 196 දෙනා බෙදා හරෙන මුධාන මූලධර්ම දෙක දක්වන්න.

(i) ……………………………………………………………………………………………………………………
(ii) ……………………………………………………………………………………………………………………

49. ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයෝ වර්ග දෙක දක්වන්න.
(i) ……………………………………………………………………………………………………………………
(ii) ……………………………………………………………………………………………………………………

50. නූතන රාජ්‍ය විදේශ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්නා වූ ප්‍රධාන ක්‍රමවේද දෙකක් නම්කරන්න.
(i) ……………………………………………………………………………………………………………………
(ii) ……………………………………………………………………………………………………………………

❋❋❋

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாண கல்வித்திணைக்களம் - வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

**13 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය -2024**

**දේශපාලන විද්‍යාව 11** | 23 | S | 11

පාසලේ නම :- ........................................

ඇතුළත්වීමේ අංකය :- ........................................

**පැය තුනයි** | **අමතර කියවීම් කාලය -මිනිත්තු 10**

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :-**

❊ **මෙම ප්‍රශ්න පත්‍රය** කොටස් **තුනකින්** සමන්විතය.

❊ I කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක්ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක් ද**, III කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක්ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

## I කොටස

1. දේශපාලන අධ්‍යයනය පිළිබඳව ස්ත්‍රීවාදී ප්‍රවේශය **හෝ** බහු විෂයක ප්‍රවේශය විස්තර කරන්න. (ලකුණු 20)

2. ගෝලීයකරණය ජාතික රාජ්‍යය කෙරෙහි ඇති කරන බලපෑම විමර්ශනය කරන්න. (ලකුණු 20)

3. ( i) දේශපාලන මතවාදයක ලක්ෂණ දක්වන්න. (ලකුණු 05)

   (ii) මතවාදයක් ලෙස ජාතිකවාදයෙහි කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 15)

## II කොටස

**4.** මෙරට නූතන නුපුරුදු සමාජය වෙනස් කිරීමට යටත් විජිත පාලකයින් ගනු ලැබූ ක්‍රියා මාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**5.** 1947 සහ 1972 ව්‍යවස්ථා යටතේ විධායකයේ ස්වභාවය සහ බලතල තුළනාත්මක ව විග්‍රහ කරන්න. (ලකුණු 20)

6. ( i) 1978 ජනාධිපතිවරයා තෝරාපත් කරගැනීමේ ක්‍රමවේදය විස්තර කරන්න. (ලකුණු 15)

   (ii) එම ක්‍රමවේදයෙහි වාසි අවාසි දක්වන්න. (ලකුණු 05)

7. දහනම වන ව්‍යවස්ථා සංශෝධනයෙන් 1978 ආණ්ඩුක්‍රමයට ඇති කළ වෙනස්කම් කවරේදැයි පැහැදිළි කරන්න.. (ලකුණු 20)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## III කොටස

8. ඉන්දියානු ෆෙඩරල් ක්‍රමයේ විශේෂ ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

9. (i) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපාන සාධක දක්වන්න. (ලකුණු 10)

**(ii)** ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ අභියෝග සහ ගැටලු සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක තිබිය යුතු ගුණාංග

**(ii)** ගැටුම්වල කාර්යය.

**(iii)** රාජ්‍ය ප්‍රතිපත්ති සහ තිලබල ක්‍රමය.

**(iii)** ජාත්‍යන්තර දේශපාලනයේ රාජ්‍ය නොවන ක්‍රියාධරයෝ.

(V) ඒකීය රාජ්‍යයවල නව ප්‍රවණතා. (ලකුණු 10x2=20)

❄❄❄

PAST PAPERS WIKI



(10) WWW.PastPapers.WiKi (10)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது }



13 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024

දේශපාලන විද්‍යාව - I පිළිතුරු පත්‍රය 23 S I

## 1 කොටස

### A- කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | iv | **7** | v | **13** | iii | **19** | ii | **25** | iii |
| **2** | ii | **8** | iv | **14** | ii | **20** | iii | **26** | ii |
| **3** | v | **9** | iii | **15** | v | **21** | ii | **27** | ii |
| **4** | i | **10** | ii | **16** | v | **22** | i | **28** | i |
| **5** | iv | **11** | v | **17** | ii | **23** | iii | **29** | iii |
| **6** | iv | **12** | i | **18** | iv | **24** | iv | **30** | v |

### B- කොටස

31. I ලෝකය පිළිබඳ අතිමූලික ප්‍රශ්න ඇසීම සහ විභාග කිරීම
   II ලෝකය තේරුම් ගැනීමට අප පාවිච්චි කරන සංකල්පවල අර්ථය නිරවුල් සහ නිශ්චිත කර ගැනීමට විශේෂ උනන්දුවක් දැක්වීම/ දේශපාලනයෙහි ප්‍රතිමානීය අරමුණු ගැන දක්වන දැඩි උනන්දුව
32. 1-මැක්ස් වේබර්
   11- මහාචාර්ය කේ. සී. වියර්
33. i.බලය විතැන් කිරීම
   ii.පරිපාලනය විමධ්‍යගත කිරීම/ බලය පැවරීම
34 .i ආර්ථික පදනම
   ii. සමාජ, දේශපාලන, සංස්කෘතික මතවාදී යන මේවායින් සමන්විත උපරි ව්‍යුහය
35. i.සම්භාව්‍ය සමූහාණ්ඩුවාදය
   ii.යුරෝපයේ පුනරුද සමය/දහ අට වැනි සියවසේ ප්‍රංශ සහ ඇමරිකානු සමූහාඩුවාදය./ විසි වැනි සියවසේ සමූහාණ්ඩුවාදය
36. 1-ආගමික මූලධර්මවාදය පදනම් කොටගත් ආගමික රාජ්‍යය බිහි වීමේ හැකියාව.
   11-බහු සංස්කෘතික වාදය පදනම් කොට ගෙන, ආගමික අනන්‍යතාව ඇති සුළු ජන ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

37.i ගැටුම් විසඳා ගැනීම් සහ මන්ත්‍රණය

II ආරාවුල්කාරී සහමන්ත්‍රණය /නම්‍යශීලී සහමන්ත්‍රණය

38.i. දේශපාලන අත පෙවීම්වලින් රාජ්‍ය සේවය ආරක්ෂා ගැනීම.

ii. රාජ්‍ය සේවය පිළිබඳව සුළුතර කණ්ඩායම් අතර විශ්වාසය ගොඩ නැඟීම

39.i. යටත් විජිත ධනවාදයේ ආරම්භය සහ ව්‍යාප්තිය.

11. යටත් විජිත සමාජ පරිවර්තනය.

40.i. මූලික අයිතිවාසිකම්

ii. ඡන්ද බලය/ පාලන බලතල

41.i. ජනතාවට උත්තර දිය යුතු බව

ii. වගකීමේ අර්ථයෙන් ක්‍රියා කිරීම ජනතාව ආණ්ඩුවෙන් අපේක්ෂා කරන බව.

42.1. කොංග්‍රසයේ සභා දෙකෙහිම තුනෙන් දෙකක වැඩි ඡන්දයකින් සම්මත වීම.

2. ප්‍රාන්ත රාජ්‍ය 3/4ක අනුමතිය ලබාගැනීම.

43. i.ජාතික මණ්ඩලය

ii.රාජ්‍ය සභාව

44. i.නගර සභාව

ii.නගරාධිපති

45. i ආණ්ඩුකාරවරයා.

ii ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු පස් දෙනෙකුගෙන් සමන්විත අමාත්‍ය මණ්ඩලය.

46.i. සාම්ප්‍රදායික අධිකාරි ක්‍රමය.

11. අනුහස් හෙවත් කැරිස්මා අධිකාරි ක්‍රමය./ නෛතික තාර්කික අධිකාරි ක්‍රමය.

47.i.ආණ්ඩුව සහ දේශපාලඥයින්

ii. අධිකරණය සහ විනිශ්චයකාරවරුන් /.මහජනතාව සහ පුරවැසියන්

48.i පළාත් මූලධර්මය යටතේ ආසන 36

ii.ලියාපදිංචි ඡන්ද දායකයන්ගේ සංඛ්‍යාවට අනුපාත වන ආකාරයට ආසන 160

49. i. ජාතික රාජ්‍ය සහ අන්තර්ජාතික-රාජ්‍ය සංවිධාන

ii. රාජ්‍ය නොවන ක්‍රියාධරයෝ

50 .i. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා

ii විදේශාධාර /මිලිටරි බලය



(12) WWW.PastPapers.WiKi (12)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!